**තලාව ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තලාව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව අස්ථිත්වයක් පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු එම කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළයුතු වුවත් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අයවැයගත තොරතුරු රහිතව ඉදිරිපත් කර තිබුණි. | පිළිගනිමි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 3.7 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයට අදාළව ලැබී ඇති රු.2,459,950 ක මුද්දර ගාස්තු ආදායම් හා 2020 වර්ෂයට අදාළව ලැබී තිබූ රු.5,010,024 ක උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි | ඉකුත් වර්ෂවලට අදාළ ආදායම සමුච්චිත අරමුදලට ගැලපිය යුතුවේ. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 ක මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් වටිනාකම් සහ උපලේඛනවල සඳහන් වටිනාකම් අතර රු.81,260,569 ක වෙනසක් විය. | පිළිගනිමි. | වෙනසට හේතු සොයා බලා ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,832,314 ක මාර්ග ප්‍රතිසංස්කරණ වියදම් සනාථ කිරීම සඳහා වවුචර් ඉදිරිපත් කර නොතිබුණි. | ඉංජිනේරු නිර්දේශ අනුව ගෙවීම් සිදුකර ඇත. | සියලු වියදම් සනාථ කිරීම සඳහා වවුචර් ඉදිරිපත් කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371 (5) වගන්තිය | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් එසේ සිදුනොකර ප්‍රමාදවී පියවා තිබුණු අවස්ථා 08 කට අදාළව රු.225,200 ක් පැවතුණි. | ඉදිරියේදී නියමිත පරිදි පියවීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 371 (5) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 757(2) (ආ) | ප්‍රාදේශීය සභාවේ 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ප්‍රාදේශීය සභාවේ සහ ඊට අදාළ උප කාර්යාලවලට අයත් භාණ්ඩ වර්ග 60 කට අදාළව භාණ්ඩ ඌනතා ලෙස දක්වා තිබුණු භාණ්ඩ 90 ක් සහ පුස්තකාල පොත් 589 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 757(2) (අ) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 14 ක ඉන්ධන දහන පරීක්ෂා සිදුකර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.14,234,885 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ වියදම රු.57,025,501 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ නමින් රාජ්‍ය බැංකු ජංගම ගිණුම් 04 ක පවත්වාගෙන යනු ලබන ගිණුම්වල සමාලෝචිත වර්ෂය පුරාවට අධික ලෙස මුදල් රඳවා තබාගෙන තිබුණු අතර එම මුදල් ආයෝජනය කර කිසියම් වූ ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වනවිට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. | ජංගම ගිණුම්වල මුදල් රඳවා නොගෙන පොලී ආදායමක් උපයා ගැනීමට හැකිවන පරිදි ආයෝජනය කළ යුතුවේ. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | 2009 වර්ෂයේ තක්සේරුව පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය සඳහා රු.6,336,615 ක වරිපනම් බදු ආදායමක් රැස්කිරීමට බිල්කර තිබුණු නමුත් ඉන් තවදුරටත් රු.3,174,922 ක් අයකර ගැනීමට තිබුණි. | | |
| (ආ) | කුලී | | |
| (i) | සභාව අයත් කඩකාමර 74 වෙනුවෙන් 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.5,066,868 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පනතේ විධිවිධාන සහ ගිවිසුම් අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ii) | සභාව විසින් වෙළඳ අයිතීන් බදුදී තිබූ අවස්ථා 08 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු රු.1,052,642 ක් අයවී නොතිබුණි. | | |
| (iii) | තඹුත්තේගම උප කාර්යාල පරිශ්‍රයේ කඩ කාමර 08 ක් 2021 මාර්තු මස සිට ටෙන්ඩර් කර කඩ හිමියන්ට ලබාදී තිබුණු නමුත් එම කඩ වලින් අයවිය යුතු රු.3,195,255 ක කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |

(ඇ) බලපත්‍ර ගාස්තු

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,075,508 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පනතේ විධිවිධාන සහ ගිවිසුම් අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

(ඈ) වෙනත්

| | | |
|---|---|---|
| වසර 03 සිට  වසර 10 දක්වා කාල පරාසයක සිට පැවත එන හිඟ ටෙන්ඩර් ගාස්තු රු.430,351 ක් පවතින නමුත් එම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ  3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ  සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් වාහනයක් 2019 ජනවාරි 31 දින අනතුරකට භාජනයවීම නිසා සභා අරමුදලට සිදු වූ රු.373,585 ක අලාභය සම්බන්ධයෙන් මු.රෙ 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශව හඳුනාගෙන නොතිබුණි. | පිළිගනිමි. | මු.රෙ. 104 පරීක්ෂණයේ නිගමන අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | සභාවේ සභාපතිවරයා විසින් භාවිතා කරනු ලබන කැබ්රථය 2019 අප්‍රේල් 15 දින අනතුරකට භාජනය වී තිබුණු අතර රක්ෂණ ආයතනයෙන් ඉදිරිපත් කළ වාර්තාව අනුව අලාභ හානිය රු.3,400,520 කට ඇස්තමේන්තු කර තිබුණි. මෙම අනතුර සිදුවී වසර 02 කටත් වැඩි කාලයක් ගතවී තිබුණු නමුත් එය අළුත්වැඩියා කර නොතිබුණු අතර එම අළුත්වැඩියාව සඳහා වැයවන මුදල රක්ෂණයෙන් අය නොවන්නේ නම් සියයට 90 ක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් සහ ඉතිරි සියයට 10 රියදුරුගෙන් අය කිරීමට නිර්දේශ ලබාදී තිබුණු නමුත් එම මුදල් අයකරගෙන නොතිබුණි. | පිළිගනිමි. | අනතුර සම්බන්ධයෙන් වූ අළුත්වැඩියාව කඩිනමින් සිදුකර රක්ෂණ වන්දි ලබාගැනීමට හෝ පරීක්ෂණ වාර්තාව අනුව කටයුතු කිරීම සිදු කළයුතු වේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියෙන් ලැබුණු රු.5,760,735 ක ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද කරගහවැව කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට 2012 ජනවාරි 27 දින ගිවිසුම් ගතවී මාස 06 ක කාලයක් තුළ එහි වැඩ අවසන් කළයුතුව තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් එහි වැඩ අවසන්වී නොතිබුණි. මේ සඳහා රු.1,077,389 ක වියදමක් සිදුකර එම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | ඉදිරියේදී සභාවට ලැබෙන අරමුදල් අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | හැකි ඉක්මනින් මෙම ව්‍යාපෘතිය අවසන් කළ යුතුවේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.892,000 ක් වූ සභාවට අයත් වාහන 03 ක් සහ වටිනාකම් අනාවරණය නොවූ ට්‍රැක්ටරයක් හා ඇඹරුම් යන්ත්‍රයක් වසර 02 – 15 අතර කාලයට සිට භාවිතයට නොගෙන නිශ්කාර්යව තිබුණි. | පිළිගනිමි. | මෙම වත්කම් නැවත වෙන්දේසි කිරීමට හෝ අළුත්වැඩියා කර නැවත ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2017 වර්ෂයේදී රු.9,500,000 ක වියදමක් දරා ඉදිකරන ලද තඹුත්තේගම සතිපොළ ගොඩනැගිලි පද්ධතිය ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර බදාදා සතිපොල තඹුත්තේගම නගර මධ්‍යයේ මාර්ගය අවහිර වන ලෙස ආවරණ ඉදිකරමින් පැවැත්වීම සිදුකරමින් පැවතුණි. | ඉදිරියේදී සතිපොළ නව ඉදිකිරීම් සහිත භූමියට ගෙන යාමට කටයුතු කරමි. | නව සතිපොළ භූමිය කඩිනමින් භාවිතයට ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් රු.5,421,890 ක් වැය කරමින් එප්පාවල ප්‍රදේශයේ ඉදිකර තිබුණු ආදාහනාගාරය ඊට අවශ්‍ය උදුන් සවි නොකිරීම නිසා ප්‍රයෝජනයට නොගෙන පූර්ව වර්ෂ 03 ක් ඉක්මවූ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | ඉදිරි මාස 02 ක ඇතුළත මෙහි ඉදිකිරීම් අවසන් වීමට නියමිතව ඇත. | උදුන් සවිකිරීම කඩිනමින් අවසන් කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. |